1 වන පිටුවෙන්.....

# අපේ ප්‍රශ්න විසඳුමට ඇති අපේ අයිතිය

## ඉන්දියාවේ අත දැමීම

ඉන්දියාව හිටපු අගමැති රජීව් ගාන්ධි යටතේ ශ්‍රීලංකාවේ ආරක්ෂක හා පාලන කටයුතු වලට අනිසි ලෙස මැදිහත් වූ හැටි අපට හොඳින් මතකය. එම ප්‍රයත්නය ඉන්දියාවටම අන්ත පරාජයක් අත්කර දුන් අතර එහි අනිටු ප්‍රතිඵලය වූයේ රජීව් ගාන්ධිට තම ජීවිතය පවා නැතිවීමය. ඉන්දියාවේ සමහර පියවරවල් ලංකාව සමග යුද්ධයකට පටලැවෙන්නට තරම් සමීප දේවල් වූ අතර එකල අපේ පාලකයන් ඒවා වැඩිදුර යන්නට ඉඩ නොදුන් නිසා ගොඩින් බේරාගන්නට හැකිවීය.

ලංකාව ඒ කරදර වලට මුහුණ පා වසර විසිපහකට වැඩි කාලයක් ගතවී ඇතත් අපට ඒවා හොඳින් මතකය. ඒ මතකය තවමත් අප තුළ හොල්මන් කරයි. අප කුරිරු කොටි ත්‍රස්තවාදය ජයග්‍රාහීව අපරටින් තුරන්කර දමා තිබියදී ඉන්දියාව කිසිදු ලැජ්ජාවක් නැතිව ඒ පරණ පොතම පෙරළගෙන නැවතත් අප ග්‍රහණයට ගන්නට උත්සාහයක යෙදෙමින් එන හැටි පෙනේ. “ අපේ පළහිලව් වලට ඇඟිලි නොගසා උඹලාගේ වැඩක් බලාගෙන පැත්තකට වෙයල්ලා ” යයි අප ඉන්දියාවට කිව යුතු කාලය දැන් පැමිණ ඇත. එසේම ඉන්දියාවේ සුරතල් ඔඩොක්කු කුක්කන්ව නිතර ඉන්දියාවට දුවමින් සිටින උතුරේ දෙමළ දේශපාලකයන්ට අප කිව යුතු දෙයක් වෙයි.

එනම්: “ දැන්වත් වැඩුණු මිනිසුන් වශයෙන් සිතා ප්‍රශ්න වලට මුහුණ දෙමින් ලංකාවේ දෙමළ ජනතාවගේ ප්‍රශ්න ලංකාව තුළම විසඳ ගන්නට අවශ්‍ය කටයුතු කරපල්ලා” යන්නයි.

## නිවැරදි පියවර

කොටි ත්‍රස්තවාදය විජයග්‍රාහීව අවසන් වූ මොහොතේ දේශය අමතමින් යුද්ධයෙන් නොව සාකච්ඡා මාර්ගයෙන්ම රටේ ප්‍රශ්න විසඳා ගැන්මට කටයුතු කරනවා යයි කී ශ්‍රීලංකා ජනාධිපතිවරයා ඒ පොරොන්දුව අනුව දෙමළ ජාතික සංධානය සමග සාකච්ඡා කළ සැටි අපි දුටුවෙමු. එසේම එම සංධානය දෙපැත්තට ඇද පැද යෝජනා කළේ කලින් ඔවුන් තුළ පැවතුණ ඉල්ලීම් මය. ඒ අනුව අපට මනාව පෙනී යන්නේ නැවත ඒ මග යෑම නිෂ්ප්‍රයෝජන කාර්‍යයක් බවයි. එසේ යෑමෙන් ප්‍රශ්න විසඳනවා තබා එයට පිවිසෙන්නට වත් හැකි කමක් ලැබෙන්නේ නැත. ජනාධිපතිවරයා යෝජනා කළ පාර්ලිමේන්තු විශේෂ කමිටුව ඒ සඳහා සුදුසුම මාර්ගය වන්නේය. එම කමිටුව යෝජනා කරන යම් ක්‍රියා මාර්ගයක් වේ නම් ජනාධිපතිවරයා පමණක් නොව අප සැවොම එය පිළිගත යුතු වන්නේය. මක්- නිසාද ප්‍රජාතන්ත්‍රවාදයේ උතුම්ම වූ ස්ථානය හිමිවන්නේ රටක පාර්ලිමේන්තුවට බැවිනි. මෙහිදී අප කවුරුත් අපේ පාර්ලිමේන්තු මැති ඇමතිවරුන් යොමු කරවිය යුත්තේ ජනතාවගේ මතය මැනවින් විචාරමින් ඔවුන්ගේ අදහස් රැස්කරමින් ගොනුකරමින් අවංකවද කාර්යක්ෂමවද ක්‍රියාත්මක වෙමින් ජාතික සංවර්ධනයට තුඩු දෙන වැදගත්ම ප්‍රශ්නය විසඳුමක් කරා ගෙන එන්නට කටයුතු කරවීම සඳහාය.

අප රටට අදාළ ප්‍රශ්න විසඳා ගැන්ම අප රටේ වගකීමයි. ශ්‍රීලංකාව නිදහස්, සෛවරී, ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයක් ලෙස ස්ථාපිතකර තිබියදී අප රටට උචිත සහ අප රටේ ඉදිරියටද බලපාන ප්‍රශ්න වලදී ඊට පිළියම් සොයාගැන්ම සහ ඒ අනුව කටයුතුකරන්නට අපට ඉන්දියාවේ හෝ වෙනත් කුමන රටක හෝ ඇඟිලි ගැසීම් අවශ්‍ය නැත. අපේ ගෙදර මතුවන අර්බුදයකට පිට මිනිසුන්ගේ අවශ්‍යතා අනුව කටයුතු කරන්නේ කුමකටද? ප්‍රශ්නය අපේ නම්, එය ඇතිවුණේ අප රටේ වැසියන් අතර නම්, විසඳුමද අප ම සොයාගත යුතුය. එය අපට කළ හැකිය. ඒ සඳහා හොඳම උදාහරණයද අප රට තුළින්ම පෙන්විය හැකිය. එනම්, අවුරුදු 30 ක් තුළ ඔඩුදුවා තිබූ භයානකම ත්‍රස්තවාදී ප්‍රශ්නය සාර්ථකව අපම විසඳා ගත් ආකාරයයි. නෝර්වේ හෝ වෙනත් යුරෝපීය රටක් හෝ ඉන්දියාව හෝ කියන පරිදි කටයුතු කළා නම්, එහෙනම් ලංකාව මේ වන විට කෑලි කැඩී නැති භංගවී අවසානය. අපේ බුද්ධිය අපේ තීරණ අපේ නොපසුබට උත්සාහය නිසා ඒ විනාශය සිදු නොවී රට ඒ මාර මුඛයෙන් ගොඩට ඇද ගන්නට අපේ ජනතාවට හැකිවිය. ඒ ඉස්තරම් හැකියාව තිබියදී එක එකාගේ ඔජිනියන් අසමින් උන්ට ඇඟිලි ගසන්නට ඉඩදී නැවතත් සතුරන්ට ලංකාව විනාස කරන්නට පොටක් පාදා දිය යුතුද? අපේ ප්‍රශ්න විසඳාගැන්මට අපට අයිතියක් ඇත. අප කටයුතු කළ යුත්තේ ඒ අනුවය.

# සතුරු මිතුරු දඹදිව තුරු....

# ඉන්දියාව හතුරෙක්ද? ඉන්දියාව මිතුරෙක්ද?



රජීව් , නරසිංහ රාඕ සහ ඉන්දිරා ගාන්ධි 1994 බොම්බායේ පැවති රැස්වීමකදී ....

♦ වකුල ගුණපාල විසිනි



ඉහතකී ශීර්ෂය මා උපුටා ගත්තේ නුදුරු අතීතයේ අපේ රටේ කුඩා ළමයින් හැංගිමුත්තන් සෙල්ලම් කරද්දී ගායනා කළ “ අතුරු මිතුරු දඹදිවතුරු රාජ කපුරු හෙට්ටියා ” නමැති කවියක මුල් පද වලිනි.

ශ්‍රීලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවති සමයේ ඉංග්‍රීසීන් විසින් ඉන්දියාවෙන් ශ්‍රීලංකාවේ තේවතු වල වැඩට සේවකයන් ගෙන එන ලදී. එය හඳුන්වන ලද්දේ Indentured labour යනුවෙනි. එහි අදහස නීතියෙන් නියම කළ කුලීවැඩ යන්නය. ඒ ඉන්දීය කම්කරුවන් සමග ඉන්දියන් ගණුදෙනු කරුවෝ සහ ආයෝජකයෝද අප රටට ආහ. වෙළඳ කටයුතු වලට අමතරව අශෝභන පුද්ගලික මුදල් ගණු දෙනු සේවාවන්ද ඒ ඉන්දියන් බිස්නස්කාරයෝ පටන් ගත්තෝය. මුදල් පොලියට දෙන බායිලා ලංකාවට බෝ වුණේ ඒ විදියටය. ඉහත ළමා කවියේ **රාජකපුරු හෙට්ටියා** යනුවෙන් සඳහන් වන්නේ දඹදිවින් හෙවත් ඉන්දියාවෙන් පැමිණ ගිනි පොලියට සල්ලි දුන් චෙට්ටියාර් පිරිස ගැනය. ලංකාවේ ප්‍රධාන නගරවල ඒ පොලීකාර හෙට්ටි සිටි අතර, කොළඹ එක්තරා වීදියක් හෙට්ටිවීදිය වුණේ ද ඒ නිසා ය. ශ්‍රීලංකාව බ්‍රිතාන්‍යයෙන් නිදහස ලබන විට ලංකාවේ තත්වය තිබුණේ ඔය ආකාරයටය.

## සතුරෙක් ද මිතුරෙක් ද ?

ඉහතකී කවියේ ඇති තවත් සැඟවුණු අරුතක් නම් ඉන්දියාව අපේ මිතුරෙක් ද සතුරෙක් ද යන්න ඉඟියෙන් ඇසීමයි. ඒ කවිය ලියූ කාලයේ අපේ ජනතාව ඉන්දියාව දෙපිට කාට්ටු චරිතයක් යයි හඳුනාගෙන සිටි බව පෙනේ. ඉන්දියාවේ ඒ දෙපිටකාට්ටු භාවය අතීතයේ සිට මේ අද දවස දක්වාම ඔවුන් අප කෙරෙහි හැසිරී ඇති අකාරයෙන් පැහැදිලි කරගත හැකිය. අපට නිදහස ලැබී බොහෝ කාලයක් යනතුරු කොළඹ පිටකොටුවේ තොග සහ සිල්ලර වෙළඳාම ද ආහාර ද්‍රව්‍ය හා රෙදිපිළි රටට ගෙන්වීමේ කාර්යයන්ද මුළු මනින්ම තිබුණේ ඉන්දියන්කාරයින් අතය. එයින් නිදහස්ව අපේ බැංකු සේවයක්ද ආනයන ආදිය ද ලාංකිකයින් අතට පත්වුණේ මේ ඊයේ පෙරේදා ය. එතෙක් රටේ වාණිජ ධනය ඇදී ගියේ ඉන්දියාවට ය. ගිනි පොලීකාර බායිලා නිසා සාමාන්‍ය මිනිසුන්ට මුදල් පමණක් නොව දේපළ ඉඩකඩම් ද නැතිවිය.

මේ ලිපියේ මුඛ්‍ය අරමුණ එක විටම වාගේ බ්‍රිතාන්‍යයෙන් නිදහස ලැබූ අපත් අපේ අසැල්වැසි ඉන්දියාවත් එකිනෙකා කෙරෙහි ක්‍රියාකර ඇති ආකාරයත්, විශේෂයෙන් මෑත කාලයේ ඉන්දියාවේ හැසිරීමත් විමසා බැලීමට ය. ඉන්දියාව අපේ සැබෑ මිතුරෙක් ද නැතිනම් අවස්ථාවාදීව කටයුතු කරන සතුරෙක් ද යන්න දැනගැනීම අපට ඉදිරියට ප්‍රයෝජනවත් වෙනවා ඇත.

## නිදහස ලැබුවාට පසු

නිදහස ලැබී ඊළඟ වසර 16 දී ශ්‍රී ජවාහර්ලාල් නේරුගේ නායකත්වය යටතේ ඉන්දියාවෙන් ආසියානු කලාපයට පමණක් නොව ලෝකයටම විශිෂ්ඨ සේවයක් සැළසුණි. ඊට සමාන්තරව ඊජිප්තුවේ නසාර්, ඝානාවේ නිකෲමා, චීනයේ චෞ එන් ලායි ආදී නායකයින් වූ අතර ඉන්දියාව අපේ අසල්වැසියා වීම අපට ද ඉමහත් ආඩම්බරයක් වූයේ ය. නොබැඳි ජාතීන්ගේ සමුළුව ආරම්භ වූයේ ද මේ සමයේ දී ය.

නේරු සිය දියණිය ඉන්දිරා යම් දිනක තමාගෙන් පසු ඉන්දියාවේ නායකත්වය දැරීම සඳහා පුරුදු කරන්නට ඉදිරියට ගෙන ආවේ මේ කාලයේ ය. එසේම ඉන්දියාව සමාජවාදී රටවල් සමග, විශේෂයෙන් සෝවියට් රුසියාව හා සමීපවූවා පමණක් නොව තම අවට සීමාවන් පළල්කර ගන්නට ද වූවා ය. ඒ නිසාම ඉන්දියාවට 1962 දී චීනය සමගත්, 1962 දී පකිස්ථානය සමගත් ගැටෙන්නට සිදු විය. ගැටුම් අවසන් වූයේ චීනයේ ඒක පාක්ෂික සටන් විරාමයකින් හා දෙවන වර එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත්වීමෙනි.

## ඉන්දිරා බලයට පැමිණීම

1966 දී ශ්‍රී නේරුගේ අභාවයෙන් පසු ඉන්දිරා ගාන්ධි මැතිණිය එහි අගමැති ධුරයට පත්වූවාය. බණ්ඩාරනායක මහත්මිය අගමැතිනිය වූ පසු ශ්‍රීලංකාව හා තිබුණු මිත්‍රත්වය තවත් පුළුල් වූයේය. කච්චතීව් ආරවුල තිබුණු කාලයේ එය සහයෝගයෙන් විසඳුණේ එම දූපත අපට ම දෙමිනි. එම ප්‍රථම වාරයේ ඉන්දිරා සිය පාලනය වඩාත් ශක්තිමත් කර ගත් අතර, කොන්ග්‍රස් පක්ෂයේ බලයද වැඩුණේය. නැගණහිර පකිස්ථානය බටහිර පකිස්ථානයේ පාලනයෙන් මිදෙන්නට කැරළි ගැසූ අවස්ථාවේ ඉන්දියාව නැගණහිරට උදව් කළාය. ඉන් බංගලාදේශය නම් අළුත් රටක බිහිවිය. එය ද ඉන්දිරාගේ ජයග්‍රහණයක් ලෙස බොහෝ දෙනා දුටුවෝ ය. එනිසාම ඇය දෙවන වාරයේ ද විසල් ජයක් ලැබුවා ය.

## ඉන්දිරාගේ දෙවන වාරය

ඉන්දියාව ඉක්මනින් වෙනස්වනු පෙනිණ. නව ධනවාදී බලවේග මතුවන්නට විය. එරට ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී දේශපාලනයක් ඔස්සේ ගමන් කළත් නව ධනවාදයට සිය බලය තහවුරුකරගැන්මට ඕනෑ විය. රටේද කොන්ග්‍රස් පක්ෂය තුළ ද අභ්‍යන්තර ගැටුම් මතු වුණි. බලය ඇගේ හිසට මේ වන විට ඇතුල් වී තිබුණි. කොන්ග්‍රස් පක්ෂයේ කොටසක් කඩාගෙන ගියේය. දෙවන වාරය අවසන් වනවිට බලයේ රැඳී සිටීම සඳහා ඉන්දිරාට හදිසි නීතිය යොදවන්නට ද සිදුවුණේ ය.

එය දෙමළ බෙදුම්වාදී කණ්ඩායම් ශ්‍රීලංකා රජයට එරෙහිව ත්‍රස්තවාදය ක්‍රියාත්මක කළ තිබූ අවධියයි. ඉන්දියාව මෙහිදී දෙබිඩි පිළිවෙතක් පටන් පටන්ගත්තා ය. ලංකා රජයට හිතවත් බව අඟවමින් දෙමළ ත්‍රස්තයින්ට ඉන්දියාවේ පුහුණු කඳවුරු තනා දුන්නාය. එල්ටීටීඊ සහ ඊරෝස් යන කණ්ඩායම් ඉන්දීය රජයේ **රෝ** නම් ( RAW ) ඔත්තු සේවය මගින් පුහුණු කරවන්නට ද පටන් ගත්තේ මේ කාලයේ දී ය.

## තමිල් නාඩු දේශපාලනය සහ අපි දෙමළ සංවිධානය

ඉන්දීය මධ්‍යම ආණ්ඩුව යටතේ සිටිමින් අද තමිල්නාඩුව ලංකාවේ දෙමළ ප්‍රශ්නයට දක්වන ආකල්පය උනන්දුව සහ සහයෝගය කෙතෙක්දැයි අපි දනිමු. වෙනම දෙමළ රාජ්‍යයක් බිහිකිරීම සඳහා මුලින්ම සූදානම් වූ පිරිස තමිල්නාඩුවේ 1960 දී බිහිවූ **අපි දෙමළ** නමැති සංවිධානයයි. ඒ ගැන දැනගත් වහාම ඉන්දීය රජය එය කඩා බිඳ සුණුවිසුණු කර කිසිම කෙනෙකුට ඉන්දියාව තුළ වෙනම රාජ්‍ය බිහිකරන්නට කතාකිරීම පවා තහනම් වන අයුරින් ව්‍යවස්ථා නීතියක් පණවා පාර්ලිමේන්තුවේ සම්මත කරගත්තාය. එවැනි දෙයක් තමිල් නාඩුවේ යළිත් නැග ඒම වැලැක්වීම සඳහා ඉන්දියාව කළේ තමිල් නාඩු දේශපාලකයින් කරන වැඩ වලට බුරුලක් පෙන්වීමය. ලංකා දෙමළ ජනතාව වෙනු වෙන්ය කියා තමිල්නාඩුවේ කරන සියළු විගඩම් ඉන්දීය මධ්‍යම රජය ඉවසා සිටින් නේ ඒ නිසා ය.

බංගලාදේශය පිහිටුවන්නට තමාගේ රජය මූලිකත්වය ගැනීම ඉන්දිරාගේ ඔලුවට ගිය නිසා ඉන්දියාව **ලොකු අයියා** වශයෙන් ඒ මුළු කලාපයේ හැසිරෙන්නට පටන්ගත්තේය. ඒ **අයියා පාට්** ලංකාවට ද පෙන්වන්නට වූ අතර ලංකාව ඔවුන් යටතේ සිටිය යුතුය යන හැඟීම ඉන්දියාවට ඇතිවිය. ඉන්දියාවේ ඒ මහන්තත්ව සිතුවිල්ල අප බිඳ දැමිය යුතු ය.

හදිසිනීතියේ පිහිටෙන් බලයේ එල්ලී සිටි ඉන්දිරාගේ දෙවන වාරය අවසානයේ ඇය පැරදුණු අතර භාරතීය ජනතා පක්ෂය බල යට ආවාය. 1980 දී යළිත් ඉන්දිරා බලයට එනවිට ඉන්දියාවේ ප්‍රාදේශීය දේශපාලන ගැටුම් ඉතා නරක තත්වයට වැටුණි. ඇය ලංකාව සහ කොටිසංවිධානය සමග තම දෙබිඩි පිළිවෙත දිගටම ගෙනගියාය. ඉන්දියාව නිසාම කොටි තව තව ශක්තිමත් වූහ.

## විනාශය ගෙනා 3 වන වාරය

අප කවුරුත් දන්නා පරිදි ඉන්දිරාගේ තුන්වන වාරය අවසාන වූයේ සීක් බෙදුම්වාදී ව්‍යාපාරය මැඩලීම පිණිස ඉන්දීය රජය සීක්වරුන්ගේ අම්රිස්ටාර් සිද්ධස්ථානය තුළට හමුදාව යැවීමෙනි. එහි තුළ ලේ වැගිරීමක් ද විය. සීක්වරු එහි පලිය ගත්තේ ඉන්දිරාගේ සීක් බොඩිගාඩ්ම ලවා ඉන්දිරා ඝාතනය කරවීමෙනි. මේ වන විට එල්ටීටීඊය ප්‍රබල ත්‍රස්තවාදී සංවිධානයක් බවට පත්වී අවසානය. ඒ සමගම තමිල් නාඩුව තුළ ද එය නිදහසේ ක්‍රියාත්මක වන්නට වීය.

## රජීව් සහ ඉන්දු-ලංකා ගිවිසුම

ඉන්දිරාගේ මරණයෙන් පසු රජීව් ගාන්ධි අගමැති වූයේ ය. ඒ කාලයේ ම ශ්‍රීලංකාවේ දේශපාලනය ද වෙනස් වෙමින් ඇමරිකාවට පාක්ෂික ජේ. ආර්. ජයවර්ධන පත්විය. ධනවාදය පසුපස හඹායමින් සිටිය මුත් රුසියාවට පාක්ෂික ඉන්දියාව ශ්‍රීලංකාව කෙරෙහි දැක්වූයේ සතුරු ආකල්පයකි. එල්ටීටීඊ ය ලංකා රජය සමග අප්‍රකාශිත යුද්ධයක පැටලී සිටි අතර උතුරට රජයේ හමුදා යවා තිබුණි. කොටින්ගේ ප්‍රචාරක වැඩ නිසා උසිගැන්වුණු තමිල් නාඩුව ද සිටියේ තරහෙනි. ලංකාවේ අර්බුදය දෙස නව කෝණයකින් බලනු වෙනුවට රජීව් යොදා ගත්තේ තම මව ඉන්දිරා ලංකාව දෙස බැලූ ආකාරයමය. ඉන්දියාව සහනාධාර වන්නියට හෙලන සෙයක් මවා පා ලංකා ගුවන් පථයට ඉන්දියානු ගගන යාත්‍රා ඇතුල් වී විවෘතව කළ අනිසි ආක්‍රමණය අපට මතකය. එය යුද්ධයට කැඳවීමකි. එම බලෙන් මැදිහත් වීම අවසානයේ ලංකා රජයට කොටි සංවිධානය සමග සාම ගිවිසුමක් අත්සන් කරන්නට සිදුවීය. එම ගිවිසුමට අනුව රජයේ හමුදාවන්ට උතුරෙන් ඉවත් වන්නට ද කොටින්ට ආයුධ සියල්ල බාරදෙන්නට අණ ලැබිණ.

ගිවිසුමට අනුව IPKF (Indian Peace Keeping Force) හෙවත් ඉන්දීය සාම සාධක බලකාය ලංකාවට ආවේ ය.

5 වන පිටුවට ⟶